ESCR | Newsletter

ISSUE 11, OCTOBER 2014

# සරණාගතයින් යනු කවුරුන්ද?



Photo : Steve Gumaer

ලෝක ඉතිහාසය පුරාවටම සියලුම කලාප හා සංස්කෘති තුළ විශ්ව සරණාගතයින්ගේ පැවැත්ම දක්නට ලැබේ. කුඩා කාලයේදී මා ඉගෙන ගත් පරිදි, හෙරෝද් රජ කුඩා දරුවන් සමූල ඝාතනය කල සමයේදී ඉන් බේරීමට ජේසුස් වහන්සේ ඊජිප්තුවට පලා ගිය සේක. ඉන් පසුව ජේසුස් වහන්සේ වසර 10 කට අධික කාලයක් සරණාගතයෙකුව සිටී බව සඳහන් පිළිගැනේ. හින්දු ධර්මයේ සහ මහා භාරතයේ විවිධ අවස්ථා වල රක්ෂාස්ථාන සොයා යන පුද්ගලයන් පිළිබඳව සඳහන් කර ඇත. ඉස්ලාම් ධර්මයේ ශුද්ධ වූ කුරානයේ විශේෂයෙන්ම සරණාගතයන් පිළිබඳව සඳහන් කරනු ලබයි: "කොයියම් හෝ අවිශ්වාසිකයෙක් ඔබගේ පිළිසරණ පතා පැමිණියහොත්, ඔහුට පිළිසරණය වන්න එවිට ඔහුට අල්ලාහ්ගේ වචනය ඇසෙනු ඇති අතර, පසුව ඔහුට සුරක්ෂිතව සිටිය හැකි ස්ථානයකට ඔහුව ඇරලවන්න." (සුරහ් 9:6)

## පකිස්ථානය හා ඇෆ්ගනිස්ථානය

හොංකොංහීදී මම සරණාගතයින් හට පිහිට වන වැඩ සටහනක, විශේෂයෙන් හොංකොං වලට රැකවරණය පතා පැමිණි ශ්‍රී ලාංකිකයන් අතර ස්වේච්ඡා සේවකයෙක් සහ නීති සහයකයෙක් වශයෙන් කටයුතු කළෙමි. පකිස්ථානයේදී, මගේ සංචාරය අතරතුර, ආගමික මූලධර්මවාදයේ කෲරත්වය පිළිබඳව මා හට මනා අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. 2008 දී මා නැවත පැමිණි දා පටන් ශ්‍රී ලංකාවේදී, මට පකිස්ථානු හා ඇෆ්ගනිස්ථානු සරණාගාතයින් (පිළිසරණය පතා පැමිණියවුන්) දහස් ගණනක් හමුවිය. කොළඹ පිහිටි එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයට (UNHCR) සරණාගතයින්ගේ තත්ත්වය නිර්ණය කිරීමේ ඉල්ලුම් පත පිළියෙල කරන අතරතුර, මා හට පකිස්ථානයේ අහමඩී, ක්‍රිස්තියානි සහ ෂියා ප්‍රජාවන්ගෙන් ඔවුන්ට මුහුණපාන්නට සිදුවූ දැඩි වධ හිංසනයන් පිළිබඳව දැන සිටියමුත්, ඔවුන්ගේ එම සිද්ධීන් පිළිබඳව තවදුරටත් සම්පූර්ණයෙන් දැනගැනීමට අවස්ථාව ලැබුණි.

1951 එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ ප්‍රඥප්තියට දකුණු ආසියාවේ කිසිදු රාජ්‍යයක් සැබැවින්ම අත්සන් තබා නොමැති බැවින් මෙම ප්‍රජාවන්ට කලාපයේ වෙනත් ස්ථානයක (ඔබ්බට) රැකවරණය පතා යාමේ හැකියාවක් නොමැත. ශ්‍රී ලංකාව ඔවුන්ට ජීවත් වීමට ඇති එකම බලාපොරොත්තුවයි. අපේ උප කලාපය ලෝකයේ විශාලතම සරණාගත ප්‍රජාවට පවතින වාසස්ථාන වලින් එකක්ව තිබියදීත්, දකුණු ආසියානු සරණාගතයින් හට නීතිමය උරුමයක් (රැකවරණයක්) නොමැත. ඔවුන්ගේ ප්‍රමාණය ආසන්න වශයෙන් 3,000,000 වන අතර පකිස්ථානය තුළ ඇෆ්ගනිස්ථාන සරණාගතයින්ද, ඉන්දියාවේ චින් සරණාගතයින්ද, බංගලාදේශයේ රොහින්ග්‍යා සරණාගතයින්ද, මෙන්ම ඉන්දියාවේ ශ්‍රී ලාංකික හා ටිබෙට් සරණාගතයින්ද වාසය කරයි.

පකිස්ථානය තුළ ආගමික මූලධර්මවාදය බහුලව පවතින අතර පකිස්ථානු දණ්ඩ නීති සංග්‍රහයේ 295සී වගන්තිය යටතේ පවතින දේවාපහාස නීතිය මඟින් රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් හට සුළු ජාතික වධ හිංසනයට ඉඩ සලසා දී ඇත. 1970 ගණන් වල සිට පකිස්ථානු රජය වධ හිංසනය අනුමත කර ඇත. 1974 අහමඩී විරෝධී කැරැල්ලෙන් පසුව, ඔවුන්ගේ පාර්ලිමේන්තුව මඟින් අහමඩීවරුන් මුස්ලිම්වරුන්ගේ නිර්වචනයෙන් ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව සංශෝධනය කරන ලදී. 1984 දී සංශෝධනයක් මඟින් අහමඩීවරුන්ට ඔවුන්ගේ ඇදහිල්ල ප්‍රකාශ කිරීම තහනම් කරන ලදී. විශේෂයෙන්ම, නීති විෂයක කරුණක් වශයෙන් අහමඩීවරුන් හට පල්ලි ඉදි කිරීම, පවතින පල්ලි අලුත්වැඩියා කිරීම, ඔවුන් වන්දනාමාන කරන ස්ථාන 'මුස්ලිම් පල්ලි' ලෙස නම් කිරීම තහනම් කිරීම සහ ලොව පුරා විසිර සිටින මුස්ලිම් ජනතාව විසින් සිදු කරන ආචාර කිරීම පවා ඔවුන්ට තහනම් කර ඇත.[1] 2010 දී, සංවිධානාත්මක තුවක්කුකරුවන් පිරිසක් ලාහෝර් නුවර අහමඩී පල්ලියකට ඇතුළු වී වන්දනාකරුවන් වෙත වෙඩි ප්‍රහාර/ ග්‍රැනයිට් (කුඩා බෝම්බ) ප්‍රහාර/ මරාගෙන මැරෙන ඇඳුම් කට්ටල පිපිරවීම් සිදු කොට, පුද්ගලයින් 95 දෙනෙක් ජීවිතක්ෂයට පත් කරන ලදී.[2] වඩාත් කිට්ටුම සිද්ධිය සිදු වූයේ මෙම ජූලි මාසයේදීය. ඒ වරදකරුවන් යයි පවසන අහමඩී ප්‍රජාවේ පුද්ගලයෙක් විසින් ෆේස් බුක් වෙබ් අඩවියේ අපහාසාත්මක (පහරදුන් පුද්ගලයින් විසින් අපහාසාත්මක ලෙස සලකනු ලබන) රූපයක් ප්‍රසිද්ධියට පත් කිරීමෙන් අනතුරුව, වියරු වැටුණු 1000 ක් පමණ විශාල පිරිසක් අහමඩී කාන්තාවක් සහ ඇයගේ මිණිපිරියන් දෙදෙනා මියයන තුරු පුච්චා දැමීමයි[3]. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මෙම 'ආගමික විශ්වාසය මත පදනම් වූ ඝාතනයන්'[4] නැවැත්වීමට සහ පකිස්ථානු රජයෙන් අහමඩී ප්‍රජාව ආරක්ෂා කරන ලෙසට ඉල්ලා ඇති නමුත් ඉන් කිසිදු ප්‍රතිඵලයක් ලැබී නොමැත.

වරෙක ඉතා ධනවත් ජීවිතයක් භුක්තිවිඳිමින් සිටී එහෙත් සාහසික ඝාතනයන් මෙන්ම පුද්ගලික සිදුවීම් හේතුවෙන් සියල්ල අත්හැර පලා යාමට සිදුවූ පුද්ගලයන් මට හමු විය. මෙම ජීවිත කතාවන් ඛේදනීය වන අතර පකිස්ථානයේ නීතියේ ආධිපත්‍යය පිළිබඳව බරපතල ගැටළු මතු කරනු ලබයි. නීතිය අතට ගෙන කටයුතු කරන මූලධර්මවාදී රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගෙන් රටවැසියන් ආරක්ෂා කිරීමට අවස්ථා කිහිපයකදීම පකිස්ථානු රජය අපොහොසත් විය. මා හට දූෂණයට ගොදුරු වූ, බරපතල පහර දීම් වලට ලක් වූ, වධ බන්ධන වලට ලක් වූ බොහෝ පුරුෂයන් සහ ස්ත්‍රීන් මෙන්ම ජීවිතයේ භයානක අවස්ථාවන් විඳ දරා ගනිමින් ජීවත් වූ තරුණ ළමුන් හමු විය. ඔවුන්ගේ ජීවිත පකිස්ථානු රජයේ පාලනය තුළ අනතුරුදායක තත්ත්වයකට පත්වී ඇත. එයට හේතුව පකිස්ථානු රජය එම ප්‍රශ්න නොසලකා හැරීමයි.

දකුණු ආසියානු රාජ්‍යයන් සියල්ලක්ම පාහේ බහුතරයකගේ බලපෑම, ජාතිවාදය, වෙළෙඳ ගැටළු, ජාතික ආරක්ෂාව සහ රාජ්‍ය හා දේශ සීමා තරණය සීමා කිරීම් හමුවේ ඉතා දැඩි අන්දමින් පාලනය කිරීම වලින් මහත් පීඩාවට පත්ව සිටී. මෙම සන්දර්භය තුළ විකල්ප රහිත වීමෙන් සරණාගතයින් වශයෙන් පලා යාම සිදුවිය. මෙය දකුණු ආසියානු සමාජ වල සියවස් ගණනාවක් පැරණි බහුවිධතාවය පීඩාවට පත් කරනු ලබයි. මෙහි විපක්ෂ වීමට (විරුද්ධ මතයක් දැරීමට) ඉඩකඩ නොමැති වීම, සුළු ජාතීන් හට සාධාරණත්වයක් නොමැති වීම නිසා එවැනි පුද්ගලයන් හට

---

1 Banyan Asia, We decide whether you're Muslim or Not, The Economist http://www.economist.com/blogs/banyan/2010/06/state_persecution_and_pakistans_ahmadi_sect

2 ibid.

3 Waqar Gillani,3 Killed in a Facebook Blasphemy Rampage,The New York Times http://www.nytimes.com/2014/07/29/world/asia/3-pakistanis-die-as-facebook-photo-sets-off-muslim-rampage.html?_r=0

4 "Stop faith-based killings" – UN rights experts urge Pakistan to protect Ahmadiyya Muslim minorities http://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=14658&#sthash.Mz4HVjOm.dpuf

තම නිවෙස්, දේපල සහ රැකිරක්ෂා අත්හැර දමා ජීවත් වීම පිණිස සිය රටින් පලා යනවා හැර වෙනත් විකල්පයක් නොමැත. ඉන්දියාවේ කන්දාමල් ප්‍රදේශයේ තත්ත්වය ආගමික ඝාතනයන්ගේ නව රැල්ලක් ආරම්භ වීමට හේතු සාධක වී ඇත.

මියන්මාරයේ ලක්ෂ සංඛ්‍යාත රෝහින්ග්‍යාවරු දිගින් දිගටම වධ හිංසනයට ලක් වන අතර, මින් බංගලාදේශයට පලා ගිය පිරිසට බංගලාදේශයේ චිතගොන්හී කොක්ස් බසාර්හී (Cox’s Bazaar) මහත් බෙලහීන තත්ත්වයක අකමැත්තෙන් වුවද ජීවත් වීමට සිදුව ඇත. ඇතැම් රොහින්ග්‍යාවරු ජීවත්වීමේ බලාපොරොත්තුවෙන් ශක්තියෙන් අඩු පාලම් පාරු (ඔරු) රැගෙන මුහුදු තරණය කිරීමට තරම් නිර්භිත වෙති. 2008 සිට අඩුම වශයෙන් එවන් සරණාගතයින් 300 දෙනෙක් පමණ හමුවීමට මට හැකි විය. ඔවුන්ගෙන් ඇතැමෙක් මිරිහාන රැඳවුම් කඳවුරේ සිටී (ඔවුන් සරණාගතයන් ලෙස පිළිගැනීමට පෙර) අතර ඔවුන් ජීවත් වූයේ බාලදක්ෂ කඳවුරක් එක් කරමින් සැදූ කඳවුරකට සමාන කිසිදු ඉඩ පහසුකමක් නොමැතිව (තදබදයෙන් යුත්) අසරණ තත්ත්වයකය. ඔවුන්ගේ මූලික සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව කිසිදු තැකීමක් නොමැති තැන සාන්ත මයිකල් දෙව්මැදුරෙන් වැසිකිලි ඉදි කරදීමට කටයුතු කරන ලදී. එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහා කොමසාරිස්වරයාගේ රැකවරණය යටතේ තවමත් ශ්‍රී ලංකාවේ රෝහින්යාවරු ආසන්න වශයෙන් 60 දෙනෙක් පමණ ජීවත් වෙති. මගේ දීර්ඝ විස්තර කිරීම ඇතැම් විට පාඨකයන් කෝප ගන්වනු ඇත. එහෙත් මා සොයා ගත් පරිදි බොහෝමයක් ශ්‍රී ලාංකිකයන් මේ සත්‍යතාවන් පිළිබඳව නොදැනුවත්ය.

ප්‍රත්‍යාහරණය (අපරාධකරුවන් සිය රටට භාර දීම), ආපසු යැම සහ නෙරපීම හා සම්බන්ධ අන්තර්ජාතික ප්‍රමිතීන් සමඟ අනුකූල වීම තහවුරු කිරීමෙහිලා, ශ්‍රී ලංකාව ‘වධහිංසනයට එරෙහි සම්මුතිය පනතේ 22/94 සහ අනෙකුත් අදාළ නීති සමාලෝචනය කිරීමට’ 2005 දී එක්සත් ජාතීන්ගේ වධ හිංසනයට විරුද්ධ කමිටුව විසින් නිර්දේශ කරන ලදී. එයට පිළිතුරු වශයෙන්, ශ්‍රී ලංකාව සරණාගතයින්ව ඔවුන්ගේ ජීවිත හෝ නිදහසට තර්ජනයක් නොවන පරිද්දෙන් නැවත හරවා යැවීම (සරණාගතයින්ගේ ආරක්ෂාව (non refoulement) පිළිබඳ අන්තර්ජාතික ප්‍රතිපත්තිය පිළිගැනීමට පොරොන්දු විය. ශ්‍රී ලංකාව ඉටු කිරීමට පිළිගෙන ඇති සියලුම අන්තර්ජාතික බැඳීම් තිබියදීත්, එය තමන්ගේ ස්ථාවරත්වයේ අචලව රැඳී සිටින අතර ඇතැම් ජාත්‍යන්තර නීති රෙගුලාසි වලට අනුකූල වීමට ප්‍රතික්ෂේප කරයි. මෙය විශේෂයෙන්ම සරණාගතයින්ගේ ආරක්ෂාව පිළිබඳ ව්‍යාවහාර අන්තර්ජාතික නීති ප්‍රතිපත්තිය හා සම්බන්ධ වේ.

2014 ජුනි මාසයේදී, ශ්‍රී ලංකාව රැකවරණය පතා මෙහි පැමිණෙන්නන් අත් අඩංගුවට ගැනීමට පටන් ගත් අතර 2014 අගෝස්තු මාසයේදී ඔවුන්ව නැවත පකිස්ථානයට හා ඇෆ්ගනිස්ථානයට හරවා යැවීම ඇරඹූ අතර මේ වන විට එවැනි පුද්ගලයන් 300 කට අධික ප්‍රමාණයක් හරවා යවා ඇත.

> ඇෆ්ගනිස්ථානයේ ක්‍රිස්තියානීන් නැහැ, හිටියත් ඒ බව ප්‍රසිද්ධියේ කියන්න ඒ අය බයයි කියා ජෝන් ටටාරි පැවසුවේය. තවමත් ඔහු ඔහුගේ බිරිඳ සහ දියණිය සමඟ නැවත ඇෆ්ග නිස්ථානයට පිටමං කරන තුරු මිරිහාන කඳවුරේ රැඳී සිටී.
>
> ජෝන් සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් ඇෆ්නිස්ථානයේදී මරා දැමුවා හෝ මරා නොදැමුවා එය ශ්‍රී ලංකාවට ගැටළුවක් නොවේ. ලංකාවට සරලවම ඔවුන්ගෙන් නිදහස් වීමේ අවශ්‍යතාව හැර නැවත යාමෙන් ඔවුන් නිසැක මරණයට මුහුණ පෑවත් ගැටළුවක් නොමැත.

පසුගිය වසර 30 පුරාවට ශ්‍රී ලංකාවේ දේශපාලනඥයින් මෙන්ම සිවිල් සමාජ සාමාජිකයින් රට අත්හැර දමා ගියහ. ඔවුන් ශ්‍රී ලංකාවට නැවත පැමිණියේ නම් ඔවුන්ගේ තත්ත්වය කුමක් විය හැකිද? මම කිසි විටෙකත් ඔවුන් කිසිවෙකුත් ශ්‍රී ලංකාවේ සරණාගත ප්‍රජාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් කතා කරනු අසා නොමැත්තෙමි. එලෙසම ශ්‍රී ලංකාවේ රැකවරණය පතා පැමිණෙන්නන් සම්බන්ධයෙන් වන කල් තැබීමේ යෝජනා හෝ වාචික ප්‍රශ්න වලට පාර්ලිමේන්තුවේ කිසිදු ප්‍රශ්නයක් මතු වනුවත් මම අසා නැත්තෙමි.

මෙය ඉක්මවා යා නොහැකි බලවේග වලට විරුද්ධව කරන සටනක් ලෙස මා හට නිරන්තරයෙන්ම සිතුණත්, අනෙක් පසින් ඇතැම් දේවස්ථාන හා මුස්ලිම් පල්ලි මඟින් ආගම් හා ජාතිභේද නොසලකා මෙම පීඩාවට පත්වූ ජනතාවට ආධාර හා උපකාර සැපයීම මා හට සතුටට කරුණකි.

ආදි යුගයේ, හෙරෝද් රජ විසින් කරන ලද වැරදි සහගත සමූල ඝාතනයන්ගෙන් පලා ගිය ජේසු තුමා සරණාගත දරුවෙක් විය. නූතන යුගයේ විවිධ අන්තර්ජාතික සම්මුතීන් මඟින් ශක්තිමත් කරන ලද අපේ පොදු මානුෂිකත්වයන් පිළිබඳව අප විසින්ම උදම් අනමු. කෙසේ නමුත්, මෙහි කණගාටුවට කරුණ වන්නේ, හදිසියෙන් හෝ ජේසුස් වහන්සේ වසර 2000 කට පෙර ඊජිප්තුවේදී කළාක් මෙන්, රැකවරණය පතා අද ශ්‍රී ලංකාවට පැමිණියේ නම්, එතුමාව නැවත ඊශ්‍රායෙලයට හරවා යවා හෙරෝද් රජුගේ සොල්දාදුවන් අතින් මරණයට පත් වනවා ඇත.

**ලක්ෂාන් ඩයස්**[5]

---

5 Attorney at Law ,Chairman SANRIM, Colombo Urban Lawyers and Lakshan Dias Associates Legal Consultants on Refugee, Human Rights, Religious Rights & Criminal Cases.

> **රැකවරණය සොයා පැමිණෙන්නෙක්** ඔහු හෝ ඇය සරණාගතයෙක් වශයෙන් අයිතිය කියාපාන පුද්ගලයෙකි. එවැනි පුද්ගලයෙක් සිටිනුයේ ආරක්ෂාව පැතීමේ ක්‍රියාවලිය තුළය.
>
> සරණාගතයින්ගේ ආරක්ෂාව පිළිබඳව වන අන්තර්ජාතික ප්‍රතිපත්තිය **(The principle of non refoulement)** රාජ්‍යයන් මිනිසුන්ව ඔවුන් අනතුරු වලට මුහුණපෑ හැකි ප්‍රදේශ වලට බලෙන් පිටුවහල් කිරීම වළක්වන ව්‍යාවහාරික ජාත්‍යන්තර නීති වල එන ප්‍රතිපත්තියකි.
>
> **රජයේ ස්ථාවරත්වය :**
>
> විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒ. එම්. ජේ. සදික් පැවසූව ගෙනහැර දක්වමින්, **“සරණාගතයින් නැවත හරවා යැවීමේදී ඔවුන්ගේ ජීවිත හෝ නිදහසට හානි නොවන පරිදි සරණාගතයින්ගේ ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වීම 1951 සරණාගතයින් පිළිබඳ ප්‍රඥප්තියේ කොටසක් වන අතර අප එයට අයත් නොවේ. ඉතින් අපි එයට බැඳී නැත.”**
>
> **සංඛ්‍යා දත්ත**
>
> 146,000 : වෙනත් රටවල පිහිට පතා ශ්‍රී ලංකාව හැර යන ඇස්තමේන්තුගත සංඛ්‍යාව
>
> 1800 : 2014 සැප්තැම්බර් වන විට ශ්‍රී ලංකාවේ රැකවරණය සොයා පැමිණියවුන් සහ සරණාගතයින් වශයෙන් ඇස්තමේන්තුගත සංඛ්‍යාව
>
> 1500 : පකිස්ථානයේ සිට පැමිණි රැකවරණය සොයා පැමිණි අයගේ ඇස්තමේන්තුගත සංඛ්‍යාව
>
> 331 : 2014 අගෝස්තු 1 වෙනිදා සිට නැවත හරවා යැවූ රැකවරණය සොයා පැමිණියවුන් සංඛ්‍යාව

# ශ්‍රී ලංකාවේ සියදිවි හානිකර ගැනීම් පිළිබඳ ගැටළුව;

## වෛද්‍ය ටොම් විජර් සමග කළ සම්මුඛ සාකච්ඡාව



Dr. Tom Widger

2014 දී ලෝක සෞඛ්‍යය සංවිධානය විසින් "සියදිවි නසා ගැනීම වැළැක්වීම: ගෝලීය අවශ්‍යතාවක් ලෙස (Preventing suicide: A global imperative) යන මැයෙන් පළ කළ වාර්තාවේ, ශ්‍රී ලංකාව ලෝකයේ සිව්වෙනියට ඉහළම සියදිවි නසා ගැනීම් ප්‍රතිශතය වාර්තා කර ඇත. මෙය පුදුමයට කරුණක් නොවන්නේ, මන්ද 1980 ගණන් වල මැද භාගයේ සිටම ශ්‍රී ලංකාව සියදිවි නසා ගැනීම් ගෝලීය සාමාන්‍ය ප්‍රතිශතයට වඩා බොහෝ ඉහළින් තිබූ බැවිනි. මෙලෙස ඉහළ සියදිවි නසා ගැනීම් ප්‍රතිශතයක් වර්ෂය පුරාවටම අඩුනොවී පැවතීමට හේතුව සොයා බැලීම පිණිස, අපි වෛද්‍ය ටොම් විජර්ට (සසෙක්ස් විශ්ව විද්‍යාලය, සහකාර පර්යේෂක) සමග සාකච්ඡා කළෙමු. මොහු පසුගිය වසර 14 පුරාවටම මෙම සංසිද්ධිය පිළිබඳව අධ්‍යයනය කළ අතර, "Suicide in Sri Lanka : the Anthropology of an Epidemic" යන කෘතියේ කර්තෘවරයාද මෙතුමාය.

නීතිය හා සමාජ භාරයේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහන් කණ්ඩායම හට මෙම ගැටළුව සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයක් ලබා දීම පිළිබඳව වෛද්‍ය විජර් හට අපි ස්තුති පූර්වක වෙමු.

***ප්‍ර : ජාතික වශයෙන් ශක්තිමත් සියදිවි නසා ගැනීම් වැළැක්වීමේ ක්‍රමෝපායක තිබිය යුතු මූලිකාංග මොනවාද? ශ්‍රී ලංකාවේ ක්‍රමෝපායන් මනිනු ලබන්නේ කෙසේද?***

**පි :** ඇත්තෙන්ම ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් මෙය වැළැක්වීමට ක්‍රමෝපායක් නැහැ. 1996 දී ජනාධිපති මට්ටමේ උපාය මාර්ග යක් ප්‍රකාශ වුණු අතර එයින් වැඩි බර පැටවුණේ කෘමි නාශක රෙගුලාසිය (නියමය) මතය. එහෙත් මේ සම්බන්ධයෙන් සමාජීය මැදිහත්වීම සිදු වූයේ ඉතාම සුළු වශයෙනි. සුනාමිය තුළින් පවා ශ්‍රී ලංකාව පුරා වර්ධනය වූ මනෝචිකිත්සීය සේවාවන් තවත් වේගවත් වූ අතර, ඒ සඳහා සියදිවි නසා ගැනීම් වැළැක්වීමද එක් කරුණක් විය. එහෙත් මෙය කොයි තරම් දුරට සාර්ථකද නැතහොත් සාර්ථක විය හැකිද යන්න කිව නොහැකිය.

> ශ්‍රී ලංකාවේ ස්වශාරීරික හානි පමුණුවා ගැනීම සහ සියදිවි නසා ගැනීම මානසික පීඩනය නිසා නොව එහෙත් සමාජ සම්බන්ධකම් තුළින් ඇතිවන මානසික ගැටළු හේතුවෙන් සිදු වන බව සාක්ෂි මඟින් පැහැදිලිවම පෙන්වා දෙයි. මෙය මූලිකවම මනෝචිකිත්සකයන්ගේ හා සමාජ සේවකයන්ගේ වගකීමක්ද? මෙය විශේෂඥ මානසික සෞඛ්‍යය මැදිහත් වීමක් තුළින් හෝ වඩා පුළුල්, පැහැදිලි පදනමක් ඇති ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව වටා බැඳුණු සමාජීය උපාය මාර්ගයන් හා ගෘහස්ථ හිංසනය වැළැක්වීමෙන් නිරාකරණය කළ යුත්තක්ද? මේවා ශ්‍රී ලංකාව විසින් පිළිතුරු සැපයිය යුතු ගැටළු වේ.

මානව විද්‍යාඥයෙකු ලෙස ඕනෑම ජාතික නිවාරණ ක්‍රමෝපායක් තුළ, සමාජ සංස්කෘතික ගැටළු වලට දිගු කාලීන අවධානයක් යොමු වනවා දැකීමට මම කැමැත්තෙමි. ඇත්ත වශයෙන්ම කියතොත්, මවිසින් තර්ක කරනුයේ අප හට සංස්කෘතික, සමාජීය හා සෞඛ්‍යය සාධාරණත්වයක් (න්‍යායක්) පැවතිය යුතු බවයි. පළමුවෙන්ම, නිවාරණ වැඩසටහන් සංවිධානය කළ යුත්තේ සියදිවි නසා ගැනීම් පිළිබඳව රට තුළ පවතින අර්ථ කථනයන් සිත්හී තබා ගෙනය ඒවා සංස්කෘතිකමය වශයෙන් සාධාරණාත්මක වීම අවශ්‍යය. දේශීය ප්‍රශ්න වලට අන්තර්ජාතික විසඳුම් හුදෙක් ආදේශ කිරීම ප්‍රමාණවත් නොවේ. සියදිවි නසා ගැනීමට තැත් කරන පුද්ගලයන් ඔවුන්ගේ චර්යාවන් වලට හේතු (ඵලවිපාකයන්) තේරුම් ගැනීම හා එම තේරුම් ගැනීම් වලට වෘත්තීය මට්ටමේ පුද්ගලයන් පිළිතුරු සපයන්නේ කෙසේද යන්න අවබෝධ කරගෙන ඒ අතර හොඳ සම්බන්ධතාවක් ඇති කර ගැනීම තුළින් සම්පත් අපතේ යාමේ අවදානම අඩු කරගත හැකි අතර, එමඟින් සුදුසු කාලෝචිත පිළිතුරක් ලබා ගැනීමට මඟ පාදනු ඇත. මෙය ශ්‍රී ලංකාවේ ආත්ම නාශනය (ස්වශාරීරික හානි පමුණුවා ගැනීම ) අර්ථ කථනය කර ඇති ආකාරය පිළිබඳව නැවත වරක් සිතා බැලීමේ අවශ්‍යතාව පෙන්නුම් කරයි. එනම් මෙය වර්තමානයේ මානසික සෞඛ්‍යමය ගැටළුවක් වශයෙන් දක්වා ඇති තැන සිට එහි සංස්කෘතික මුල් බැස ගැනීම පිළිබඳව සැලකිල්ලක් යොමු කිරීම දක්වා අවදානය යොමු කිරීම අවශ්‍යය. මෙවන් නැවත සිතා බැලීමක් සිදු කිරීම පහසු කර්තව්‍යයක් නොවන්නා සේම මෙහිදී විශාල වැඩ කොටසක් කිරීමට සිදුවේ. මෙය සෞඛ්‍යය හා සමාජ පර්යේෂකයන් අතර අන්තර්ක්ෂේත්‍ර සහයෝගීතාවක් සහ නිරන්තර කතිකාවන් ගොඩ නැගීමක් ඉල්ලුම් කරයි.

දෙවනුව, නිවාරණ වැඩසටහන් කළ යුත්තේ සියදිවි නසා ගැනීම් වලට මඟපාදන විෂමතාවන් නැවත නැවතත් ඇතිවීම වැළැක්වීමටයි. ඒවා සමාජීය වශයෙන් සාධාරණ (අපක්ෂපාතී) වීම අවශ්‍යය. ශ්‍රී ලංකාවේ, සියදිවි නසා ගැනීමේ ප්‍රවණතාවන් එයට හේතුවන සමාජ සම්බන්ධතා කෙරෙහි අවදානය යොමු කර ගැනීමටයි. මෙයට නිරන්තරයෙන් හේතු වන්නේ, ඇතැම් ශාරීරික හෝ මානසික වධ හිංසනයන් හෝ දූෂණයන් වේ. මෙයට නිදර්ශන වශයෙන්, ළමුන් හා කාන්තාවන්ට විරුද්ධව සිදු වන අඩත්තේට්ටම්, කාන්තාවන්ගේ ශරීරිකව ලිංගිකව පාලනය හෝ කාන්තාවන් විදේශයන්ට සංක්‍රමණය වීම කරණ කොට ගෙන පාලනය කිරීමට තැත් කිරීම ගත හැකිය. පුරුෂ පාර්ශ්වයේ සියදිවි නසා ගැනීම් වැඩි වශයෙන් සිදුවන්නේ පුරුෂත්වය අභියෝගයට ලක්වීම හේතුකොට ගෙනය. මෙම සන්දර්භය තුළ ස්වයං හානි පමුණුවා ගැනීම ඉතා වැදගත් අවදානම් සහගත වුවද භාහිර පුද්ගලයන්ගේ අවදානය නොලැබෙන අවස්ථාවල හැඟීම් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දෙයි. එම අවස්ථාවන් සීමා කිරීම යනු යම් පුද්ගලයෙකුට ඔවුන්ගේ ජීවිත වෙනස් කර ගැනීමට ඇති හැකියාව සීමා කිරීමය. සාරධර්මීය වශයෙන් විවාදයට ගත හැකි කරුණකි. සෞඛ්‍යය සේවකයන් ජීවිත බේරා ගැනීමට තමන් දුන් පොරොන්දුවට ගරු කළ යුතුසේම රෝගීන්ට 'හානියක්ද නොකළ යුතුය'. රෝගීන් මානසික හා සමාජීය උපදේශනයන් අවසන් වූ පසුව, අයහපත් ගෘහස්ථ පසුබිමකට නැවත යැවීමේ වර්තමානයේ පවතින ප්‍රවණතාව වැළැක්විය යුතුය. මෙය සිදු කිරීමට නියෝජිත ආයතනයන් අතර යහපත් සම්බන්ධතාවක් ගොඩනඟා ගැනීම අවශ්‍ය වේ. උදාහරණයක් වශයෙන්, මානසික සෞඛ්‍යය හා සමාජ සේවාවන් අතර යහපත් සම්බන්ධතාවක් ගොඩනැගීම තුළින් ප්‍රජාවන්ට ලබා දෙන සේවය අනුකූලනය වේ.

තුන්වනුව, උසස් සංස්කෘතික හා සමාජීය සාධාරණත්වයක් තුළින් උසස් මට්ටමේ සෞඛ්‍යය සාධාරණත්වයකට මඟ පෑදිය හැකිය. මානසික පීඩනය පිළිබඳ පෙළ පොත් වල අර්ථකථනයන්ට නොග ැළපෙන සියදිවි නසා ගැනීම් ප්‍රවණතාවන් හමුවේ, බොහෝමයක් සෞඛ්‍යය සේවකයින් උත්සාහ කරනුයේ අනවශ්‍ය වේදනාකාරී ප්‍රථමාධාරයන් ලබා දීම මඟින් අනාගත සියදිවි නසා ගැනීම් පරිශ්‍රමයන්ට බාධා පැමිණවීමටය. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවට පමණක්

සීමා වූවක් නොවන අතර, සියදිවි හානි කරගැනීමේ මාරාන්තික නොවන ක්‍රියාවන් 'අවදානය ලබා ගැනීමට කැමැත්තක් දක්වන්නන්' විසින් සිදු කරන 'හුදු උදව් ඉල්ලා හඬා වැටීමක්' යයි පොදුවේ වැරදි වැටහීමක් පවතී. එහෙත් ඒ වෙනුවට, ඔවුන් එලෙස සිදු කළේ කුමක් නිසාද එනම් සමාජ සම්බන්ධතාවන් වෙනස් කිරීමට උත්සාහ කරන සංස්කෘතිකමය වශයෙන් අර්ථාන්විත ක්‍රියාවක් යන්න නිවැරදිව හඳුනා ගැනීම සෞඛ්‍යය සහ සමාජ සේවා වෘත්තිකයන් මෙවන් අවස්ථා වල සානුකම්පිතව කටයුතු කිරීමට හේතුවනු ඇති අතර, අවසානයේදී එතුළින් සියදිවි නසා ගැනීමට තැත් කළ පුද්ගලයින් එවැනි තීරණ ගැනීමට අවශ්‍ය නොවන තත්ත්වයකට පත් කිරීමට හේතු වේ.

***ප්‍රඃ ඩේව් රජ්, විසින් පැහැදිලිවම දිස් වන හා සාර්ථක ජාතික ඩෙංගු ව්‍යාපාරය (පසුගිය වසරේ පුද්ගලයන් 225 ක් මරණයට පත් කළ) සහ සියදිවි නසා ගැනීම් ගැන දැනුවත්භාවයක් නොමැතිවීම (පසුගිය වසරේ ජීවිත 3500 කට පමණ වගකියනු ලබන) අතර පවතිතන අසමානතාවන් පිළිබඳව "Republic Square" වෙබ් අඩවියට ලියා ඇත. සියදිවි නසා ගැනීම් පිළිබඳ සාකච්ඡා කිරීම සංස්කෘතිකමය වශයෙන් තහනම්ද? නැතහොත් රජය මේවා වැළැක්වීමට කැපවී නොමැතිද?***

**පිඃ** මට හරියටම කියන්න බැහැ සියදිවි නසා ගැනීම් පිළිබඳව කතා කිරීම තහනම්ද යන වග. සමහරක් විට මෙය ඊට වැඩි යමක් විය හැක. මන්ද ඒ සියදිවි නසා ගැනීම ප්‍රතිකාර කිරීමට අවශ්‍ය රෝගීභාවයක්ද නැතහොත් සංස්කෘතික පැවැත්මේ අංගයක් වශයෙන් පවතින සමාජ කාර්යයක්ද යන්න පිළිබඳව මිනිසුන් හරිහැටි නොදන්නා බැවිනි. ඩෙංගු වලදී, රෝගීන් (ගොදුර) පැහැදිලිවම අනතුරට ගොදුරුවූවන්ය. සියදිවි නසා ගැනීමේදී, සැමවිටම 'ස්වයංඅභිමතය' ද හේතුවක් වේ. වර්තමානයේ නිදන්ගත වකුගඩු රෝග මර්දනයේදී මෙන්ම, 1990 ගණන් වලදී සියදිවි නසා ගැනීම් වැළැක්වීමද, කෘමිනාශක ද්‍රව්‍ය රෙගුලාසිය සම්බන්ධයෙන් ප්‍රමුඛ පෙළේ ක්‍රියාමාර්ගයන් කිහපයක්ම ගැනීමට මඟ පෑදීය. ඇත්තෙන්ම, සියදිවි නසා ගැනීම වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් කෘමිනාශක ද්‍රව්‍ය තහනම් කිරීම අතින් ගත් කල ශ්‍රී ලංකාව ආසියාපැසිෆික් කලාපයේ ඉහළින්ම සිටීමට සමත්ව ඇත.

එහෙත් අපි සියදිවි හානිකර ගැනීම දෙසට හැරුණහොත්, එසේනම් ඔව්, ඉතාම සුළු වශයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙහිදී අපට ඇසිය හැකියි, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ ගෘහස්ථ හිංසනයන් හසු කරගැනීම වැනි ගැටළු සම්බන්ධයෙන් රජය විසින් සාධාරණත්වයක් ඉටු කරන්නේ කෙසේද කියා. මෙවන් ප්‍රශ්න සහ පොදුවේ මානව හිමිකම් ක්ෂේත්‍රය පිළිබඳව කතා කිරීම නිසැකයෙන්ම සමාජයීය වශයෙන් ප්‍රචලිත වූවක් නොවේ. මෙම මතය සිවිල් සමාජ හා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ඇති සමාජීය අදහස් හා සමාන වේ. නමුත් මෙම සංවිධාන වලට සියදිවි හානි කර ගැනීම වැළැක්වීම සඳහා මුල්වී ක්‍රියා කළ හැක.


***ප්‍රඃ බටහිර රටවල සහ ශ්‍රී ලංකාවේ දිවිනසා ගැනීම් වල පවතින හේතු අතර සැලකිය යුතු වෙනසක් පවතින බව ඔබ විසින් ලියා ඇත. ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගැනීම් වලට පාදක වන සංස්කෘතික සාධක මොනවාද?***

**පිඃ** මේක බැරෑරුම් ප්‍රශනයක්, මෙහි වෙනස්කම් පවතින බව මම සිතන අතරතුරම ඒවා අතිශයෝක්තියෙන් හෝ නිශ්චිතව නොදැක්වීම ඉතා වැදගත්ය. සියදිවි නසා ගැනීම ප්‍රසිද්ධියේ දකින ආකාරය සහ වෛද්‍ය දැක්මෙහි වෙනස්කම් කෙබඳුද යන්න පිළිබඳවයි මම මෙහිදී පෙන්නුම් කරන්නේ. මම හිතන්නේ ප්‍රායෝගික අවස්ථා වලදී නිරන්තරයෙන්ම නොපවසා සිදුවන දේ සහ නිරන්තරයෙන් මඟහැරුණු දේ අතර බෙහෙවින් සමාන කරුණු ඇති බවයි.

*එනම්, යුරෝපීය ඇමරිකානු සන්දර්භය තුළ බොහෝමයක් පුද්ගලයන් පිළිගනු ලබන්නේ සියදිවි නසා ගැනීම යනු මානසික පීඩනය වැනි මානසික රෝගයක මුල් බැසගත් ප්‍රතිඵලයක් ලෙසයි. 90% දක්වා ඇස්තමේන්තුගත බොහෝමයක් අවස්ථාවන් මෙයට ඇතුළත්ය. පුද්ගලයන් හට සියදිවි හානි කර ගැනීමට සිතෙන විට හෝ සියදිවි හානි කර ගනී යයි සැක සිතන අවස්ථා වලදී, ඔවුන්ව චිකිත්සා (ප්‍රතිකාරක) වැඩ සටහන් සහ/නැතහොත් ඖෂධ ප්‍රතිකර්ම අනුගමනය කිරීමට දිරිගන්වන මානසික සෞඛ්‍යය විශේෂඥවරු වෙත යොමු කළ යුතුය. සියදිවි හානි කරගැනීමේ අදහස් හා සැලසුම් පුද්ගලයෙකුට එකවර නොව එහෙත් දින, සති හෝ මාස ගණනාවක් තිස්සේ වුවත් ඇති විය හැකිය. එනිසා පවුලේ සාමාජිකයන්ට සහ මිතුරන්ට මෙම අවදානම් සහගත තත්ත්වය පෙර සිට හඳුනා ගැනීමට අවස්ථාවක් පවතින අතර ඔවුන්ට එය වැළැක්වීමට මැදිහත් විය හැකිය. සියදිවි නසා ගැනීමට අදහස් කරන පුද්ගලයන් අධික බෙහෙත් වර්ග එකතු කිරීම හෝ ඔවුන්ගේ පසුගිය ජීවිතය පිළිබඳව කතා කිරීම වැනි හැසිරීම් රටා පෙන්නුම් කරයි. ඔවුන් තමන්ගේ පාලනයෙන් ඔබ්බට ගිය විවිධ අවස්ථාවන් වල 'සිරවී' සිට ඒවායින් මිදීමට මාර්ගයක් නොදැනගෙන සිටීම පිළිබඳව චෝදනා නැගිය හැකිය. මෙවැනි සිතුවිලි පැවතීමම එවන් පුද්ගලයන්ව වෘත්තීකයෙකුගේ (වෛද්‍යවරයෙකුගේ) සහාය පැතීමට හෝ අනෙක් අයට එම පුද්ගලයාව වෛද්‍යවරයෙකු වෙත යොමු වීමට උනන්දු කරවීමට ප්‍රමාණවත් වේ. එහෙත් ශ්‍රී ලංකාවේ, මිනිසුන් සිතනුයේ සියදිවි හානි කරගැනීමේ හැසිරීම් ඇතිවනුයේ, සුළු වශයෙන් හෝ කිසිදු පෙර දැනුම්දීමකින් තොර 'ආවේගකාරී' තත්ත්වයකින් බවයි. මනෝචිකිත්සකවරු, මනෝවිද්‍යාඥවරු සහ මානව විද්‍යාඥවරු ඇතුළු රට තුළ සියදිවි නසා ගැනීම පිළිබඳව පර්යේෂණ පවත්වනු ලබන පර්යේෂකයන් පවා, මානසික පීඩනය නිසාවෙන් දිවිනසා ගැනීම් ඉතා අඩු ප්‍රමාණයක් පමණක් සිදුවන බව පිළිගෙන ඇත. එය තමන් අසන පුද්ගලයා අනුව 10% හා 40% අතර සංඛ්‍යාවක තීරණය වේ (බොහෝ දෙනෙක් බටහිර නිර්ණය කිරීමේ ක්‍රමවේදයන් භාවිතා කිරීම කොහෙත්ම නොපිළිගනී). මේ වෙනුවට, පවුල් ආරවුල් හෝ හදිසියේ ඇතිවන කලකිරීම් මගින් ඇති කළ හැකි ඉතා ප්‍රබල වේදනාකාරී හැඟීම්, ඉච්ඡාභංගත්වය සහ කෝපය පුද්ගලයන් වස පානය කිරීමක් දක්වා ගෙන යන බව මිනිසුන් ප්‍රකාශ කරනු ලබයි. සියදිවි නසා ගැනීමේ සිතුවිලි හා එවැනි සැලසුම් පැය ගණනකින් හෝ විනාඩි කිහිපයකින් වුවත් ඇති විය හැකි අතර, මෙය පවුලේ සාමාජිකයන්ට හෝ මිතුරුන්ට අවදානම්කාරී සලකුණු දැකීමට හෝ මැදිහත් වීමට ඉතා සුළු කාලයක් පමණක් ඉතිරි කරනු ලබයි. සියදිවි හානි කර ගැනීමේ අදහස් හදිසියෙන්ම ඇති වන බැවින්, පුද්ගලයින් හට තමන්ගේ ජීවිතයට හානියක් කර ගැනීමට මත්තෙන් ඔවුන්ගේ කල්පනාවන් දෙසට නැවත හැරී බැලීමට හෝ වෙනත් කිසිවෙකු සමඟ කතා කිරීමට හෝ කාලයක් ඉතිරි නොවේ.*

***ප්‍රඃ ඔබ වසර 14 තිස්සේ ඔබේ ශාස්ත්‍රීය වෘත්තිය පුරාවට ඉතා පුළුල්ව මෙම ගැටළුව පිළිබඳව පර්යේෂණ සිදු කරනු ලැබුවා. ඔබේ අත්දැකීම් වලට අනුව, ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගැනීමේ වල තේරුම් ගත හැකි ආකාර (රටා) මොනවාද?***

**පිඃ** සියදිවි නසා ගැනීමේ රටා රටක් තුළ එහි කලාපයන්, ජන වර්ගයන් සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් වේ. සිංහල සහ දෙමළ ප්‍රජාව තුළ සියදිවි නසා ගැනීමේ වැඩි නැඹුරුවක් දක්නට ඇති අතර, මුස්ලිම් ප්‍රජාව අතර එය අඩුය. එලෙසම සියදිවි නසා ගැනීමට බෞද්ධ සහ හින්දු ප්‍රජාව අතර වැඩි නැඹුරුවක් පවතින අතර, ඉස්ලාම් හා ක්‍රිස්තියානි ප්‍රජාව අතර එය බෙහෙවින් අඩුය. අවසානයේදී, සියදිවි නසා ගැනීම් වලට ග්‍රාමීය ප්‍රදේශ වල වැඩි



Dr. Tom Widger's book, 'Suicide in Sri Lanka: the Anthropology of an Epidemic'

නැඹුරුවක් පෙන්වන නමුත්, වර්තමානයේ පැරසිටමෝල් භාවිතා කර තමන්ට හානි පමුණුවා ගැනීමට උත්සාහ කිරීම සියදිවි නසා ගැනීමේ ප්‍රවණතාවය නාගරීකරණය වීම වශයෙන් උපකල්පනය කළ හැකිය.

ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගැනීමේ සහ ආත්ම නාශන උවදුරු ඇති වියහැකි හේතුකාරකයන් මත පොදු අසම්මතියන් (එකඟ නොවීම්) පවතී. එක් පසකින් සෞඛ්‍යය වෘත්තිකයන්ය. ඔවුන්ගෙන් ඇතැමෙක් සියදිවි නසා ගැනීම ප්‍රමුඛවම මානසික ආතතිය නිසා සිදුවන්නක් බව තර්ක කරන අතර, සියදිවි නසා ගැනීම් වලට මානසික ආතතිය සුළු වශයෙන් පමණක් බලපාන බව අනෙක් අය තර්ක කරනු ලබයි. අනෙක් පසින් සමාජ විද්‍යාඥයන්ය. ඔවුන්ගෙන් ඇතැමෙක් සියදිවි නසා ගැනීම් සාර්ව මට්ටමේ ආර්ථික, සමාජීය හා දේශපාලනික ආකූලතාවන් නිසා සිදු වන බව තර්ක කරන අතර, තවත් සමහරෙක් සියදිවි නසා ගැනීම් පුද්ගලයන් අතර පවතින ආරවුල් වලට සංස්කෘතිකමය වශයෙන් බැඳුණු ප්‍රතිචාරයක් බව තර්ක කරනු ලබයි.

තවම සියල්ලන්ම එකඟ වන 'අත්‍යන්ත' පැහැදිලි කිරීම් සිදු කිරීමට බොහෝ කල් ගතවන පෙනෙනමුත් මෙහි 'ආසන්නතම' හේතු පිළිබඳව එකඟතාවයක් පවතී. මෙම ආසන්නතම හේතු අතරට පවුල් හා පුද්ගලයන් අතර පවතින ආරවුල් පරාසයක් අන්තර්ගතය. උදාහරණයක් වශයෙන්, භාර්යාව හා ස්වාමි පුරුෂයා අතර, දෙමව්පියන් හා දරුවන් අතර සහ ඇතැම් විස්තෘත ඥාතීන් අතර ඇතිවන ගැටළු ගත හැකිය. බිඳුණු පෙම් සබඳතාවන්, අනියම්විවාහ සම්බන්ධතාවන් සහ විභාග අසමත්වීම් සහ රැකියා අවස්ථා අහිමිවීම් ද නිරන්තරයෙන් හඳුනා ගත හැකි හේතුකාරකයන්ය. බොහෝමයක් අවස්ථා වලදී ලැජ්ජාව සියදිවි නසා ගැනීමට මුල් වන ප්‍රධාන කරුණ වශයෙන් හඳුනා ගෙන ඇත. ආත්ම නාශනය හෝ සියදිවි නසා ගැනීම ලැජ්ජාවෙන් මිදීමට හෝ තවත් කෙනෙකු ලැජ්ජාවට පත් කිරීමට සිදු කළ හැකිය. බොහෝ අවස්ථා වලදී, ආත්ම නාශනය හෝ සියදිවි නසා ගැනීම සුදුසු සමාජීය ප්‍රතිචාරයක් ලෙස එම පුද්ගලයන් විසින් සලකනු ලබයි. උදාහරණයක් ලෙස ළමුන් සහ තරුණ කාන්තාවන් අතර ආත්ම නාශනය අන් අයට තමන්ගේ කෝන්තිය පෙන්වීමට පවතින විකල්පයක් වශයෙන් එම පුද්ගලයන් යොදා ගනී. ස්ත්‍රී පුරුෂභාවය සහ අනෙකුත් අසමානතාවන් හා සම්බන්ධිත විධික්‍රමයන් සහ ආත්ම නාශනය හෝ දිවිනසා ගැනීම අතර සැලකිය යුතු සම්බන්ධතාවක් පවතින බව පෙනේ. අවසානයේදී, බොහෝමයක් ආත්ම නාශන ක්‍රියාවන් ඇතැම් ප්‍රශ්න වලට හදිසියෙන් හා සැලැස්මක් නොමැතිව ගන්නා ප්‍රතිකර්මයක් වශයෙන්, 'ආවේගශීලීව' සිදු වන බව පවසනු ලබයි. බොහෝ කාලයක් සියදිවි නසා ගැනීමට අදහස් කරමින් සිට සියදිවි නසා ගැනීමේ අවස්ථා ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙනුයේ අල්ප වශයෙනි. එනිසා යුරෝපීය ඇමරිකානු සන්දර්භය තුළ ගොඩ නැගුණු මානසික හා සමාජීය නිවාරණයන් සඵලදායක වන අවස්ථාවන් ශ්‍රී ලංකාව තුළ අවම වීමට හේතු විය හැක.

## ප්‍රමුඛතාවන් මඟහැරුණු ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තිය

ශ්‍රී ලාංකීය ජන මාධ්‍යය තුළ ප්‍රමුඛත්වයක් ගැනීම සමත් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති වලට මහජනතාව හුරු වී ඇති අතර, දේශපාලන නායකයින් හට එය සතුටට පත් විය හැකි කරුණකි. එය විශාල මහා මාර්ග යක් වූවත්, ප්‍රයෝගික නොවන ස්ථානයක පිහිටි ගුවන් තොටුපොළක් වූවත්, ඒ සෑම ඉදිකිරීමක්ම සංවර්ධනයේ සහ අභිවෘද්ධියේ සලකුණු ලෙස සැලකේ. එනමුත් තාක්ෂණය සහ නවීන සොයා ගැනීම්, දියුණු වෙමින් පවතින සහ දියුණු රටවල් අතර වෙනස බවට පත් වී ඇති වකවානුවේ, යටිතල පහසුකම් පිළිබඳ පමණක් නොසලකා, අවබෝධය සහ දැනුම මත පදනම් වූ ආර්ථිකයකට ආයෝජනය කිරීම අත්‍යාවශ්‍ය වේ. එවැනි ආර්ථිකයක් තුළ ප්‍රමුඛත්වයක් ගන්නා අදහස් තාක්ෂණය, ව්‍යාවසායකත්වය සහ නවක සොයා ගැනීම් ශක්තිමත් වන පරිසරයක් ගොඩනැගීමට ඉවහල් වේ. ශ්‍රී ලංකාව වැනි පහළමධ්‍යම ආදායමක් පවතින රටකට, දියුණු වු රටවල් සමඟ තරඟ කිරීමට ඇති හැකියාව අවම කරන තාක්ෂණය සහ නවෝත්පාදනය අඩු වීමට පිළිතුරද, "මධ්‍යම ආදායම් උගුලෙන්" ගැළවීමට ඉතාම සුදුසු ක්‍රමයද, දැනුම මත පදනම් වූ ආර්ථිකයකට ආයෝජනය කිරීම වේ. එසේම, දැනුම මත පදනම් වූ ආර්ථිකයක් කරා යොමු වීම අනෙකුත් අඩුලුහුඬුකම්, එනම්, ස්වාභාවික සම්පත් අවම වීම හෝ භූගෝලීය පිහිටීමේ අවාසි සහගත බව යන කරුණු වල බලපෑම ආදිය අවම කරන්නා වූ ප්‍රතිඵල සහිත ක්‍රමවේදයක් වේ. මෙවැනි ආර්ථිකයකින් ප්‍රයෝජන ගැනීමට නම්, ශ්‍රී ලංකාව මහා පරිමාණ ආයෝජන වැඩසටහන්, රටේ මානව සම්පත දියුණු කිරීම සඳහා යොමු කළ යුතු වේ. මේ සඳහා සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් පොදු ජන අවශ්‍යතා වන සෞඛ්‍යය, අධ්‍යාපනය සහ සමාජ සුභ සාධන අරමුදල් සඳහා යොමු කිරීමට අවශ්‍ය වේ. එනමුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ජූලි මස ප්‍රකාශ කළ පරිදි, රජයේ ආර්ථික ප්‍රතිපත්ති දැනුම මත පදනම් වූ ආර්ථිකයකට හානිදායක වන අතර, ඒ හේතුවෙන් එය ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් කෙරෙහිද හානිදායක ලෙස බලපානු ලැබේ.

එසේම එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ සඳහන් පරිදි ඉහළ ආදායම්ලාභී ආර්ථිකයන් සහ සංස්ථායික ලෙස ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් සඳහා ශක්තිමත් ආයතනික රාමුවක් පැවතීම අතර දැඩි සම්බන්ධතාවක් පැවතීම ඉතා වැදගත්ය. එම අයිතීන් වලට සම්මත වූ සහ ප්‍රමාණවත් ජීවන, සෞඛ්‍යය, අධ්‍යාපන පහසුකම්, සමාජීය සුරක්ෂිතතාවන් අයිති වන අතර, නමුත් ඒවාට සීමා නොවේ. තාක්ෂණය, ව්‍යාවසායක් සහ නවෝත්පාදනය කෙරෙහි යොමු වීමට වෙර දරණ ආර්ථිකයන්, ඒ සඳහා අවශ්‍ය වන ආයෝජනයන් සහ සංස්ථායික රාමුව ගොඩනැගීම තුළින් පුරවැසියන්ට ඔවුන්ගේ ඉහළම නිපුණතාවයන් කරා ලඟා වීමට මඟ සැලසීමට කටයුතු කරනු ලබයි. අඩු ආදායම් ලැබෙන, පහසු, අවදානම් රහිත ක්‍රියාකාරකම් සහ ආයෝජන වලින් බැහැරට ගොස් ඉහළ ලාභ ලබා ගැනීමට ඉහළ අවදානම් ගැනීමට පුරවැසියන් යොමු වනුයේ ඔවුන්ගේ අයිතීන් සුරැකුණු පරිසරයක් තුළ පමණි. එනිසා, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් යන රාමුව තුළින් අන්තර්ජාතික මූල්‍ය අරමුදල කළ ප්‍රකාශය තේරුම් ගැනීම සුදුසු වන මෙන්ම එය ප්‍රයෝජනවත් වේ.

> අන්තර්ජාතික මූල්‍ය අරමුදල ඉදිරිපත් කළ වාර්තාව තුළ, බරපතල ලෙස සැලකිය යුතු කරුණු ලෙස අවම පොදු ආදායම්, ප්‍රමාණවත් නොවන ආයෝජන අනුපාත සහ අධික වූ පොදු ණය ගත හැකිය. මේ කරුණු සියල්ල ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරන අතර, ඒ හේතුකොට මෙරටේ ආදායම වැඩි කළ හැකි දැනුම මත පදනම් වූ ආර්ථියක් ගොඩනැගීමට ඇති හැකියාව අවම වේ.

2013 වසරේදී රාජ්‍ය හෝ පොදු ණය, ජාතික ආදායමින් 78% ක් ලෙස වාර්තා වන අතර, එය ශ්‍රී ලංකාව වැනි රටකට සුදුසු නොවන "ඉතා ඉහළ" ප්‍රතිශතයක් බව අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ නියෝජිත කෝෂි මාතායි (Koshi Mathai)[1] පවසයි. එසේම, ලංකාව ලබාගන්නා ණය ආකෘතින්ද වෙනස් වී ඇත. ශ්‍රී ලංකාව මෑත කාල වකවානුවේ ඉහළ පොළී සහිත කෙටි කාලීන ණය ලබා ගැනීමට යොමු වී සිටින අතර, එය දැනටමත් ලාංකික ආර්ථිකය කෙරෙහි අයහපත් බලපෑම් ඇති වීමට හේතු සාධක වී ඇත. පොදු ආයෝජනයන් 2011 වසරේ 6.3% සිට 2013 වසරේ 2.9% දක්වා අඩුවී ඇත.[2] (මෙම දත්ත ශ්‍රී ලංකා මහා බැංකු දත්ත වලින් වෙනස් වන අතර, ශ්‍රී ලංකා මහා බැංකුව 2013 වසරේ 6.9% ක රාජ්‍ය ආයෝජනයක් තිබූ බව පවසා ඇත).[3]

---

1 IMF – Transcript of press conference on the IMF Article IV Report (May 2nd, 2013); http://www.imf.org/external/np/tr/2013/tr050213.htm

2 IMFPress Release No. 14/371; https://www.imf.org/external/np/sec/pr/2014/pr14371.htm#P15_295

3 Central Bank of Sri Lanka – Key indicators (2013); http://www.cbsl.gov.lk/pics_n_docs/10_pub/_docs/eft/annual_report/AR2013/English/3_KEI.pdf

මීට වඩා බරපතල දර්ශකයක් වනුයේ පොදු ණය බදු ආදායම් හා සැසඳු විට පෙන්නුම් කරන 600% ප්‍රතිශතයයි.[4] එසේම ශ්‍රී ලාංකික බදු මුදල් ආදායම ජාතික ආදායමින් 11.5% පමණ වේ. මෙම ප්‍රතිශතය ආසියාවේ පහළම ප්‍රතිශත අතරින් එකක් වේ. මේ දර්ශක සියල්ල ඉතා දුර්වල ආර්ථික තත්ත්වයක් වශයෙන් ආසියානු කලාපය හා සැසඳු විට මෙන්ම තනිව සැලකූ විටද පෙන්නුම් කරයි. එනමුත් මෙම හානිකර ෆිස්කල් දුර්වලතාවයන් මහජනයාට අවබෝධ වීමට කල් ගතවේ. එයට හේතු වනුයේ මෙම අයෝග්‍ය ප්‍රතිපත්ති තුළින් හානිකර ප්‍රතිඵල ඇතිවීමට කල්ගත වීමය. එසේම එම ප්‍රතිඵල නිසාවෙන් පීඩාවට පත් වන්නේ මධ්‍යම පාන්තික සහ දුප්පත් ජනයා වන අතර, එහි ප්‍රතිලාභ ලැබෙනුයේ ඉතා අඩු කිහිප දෙනෙකුට පමණි. මෙම සමබර නොවූ බලපෑම් නිසා ආර්ථික සංශෝධන සඳහා ඇති අවදානය රට තුළ පවතින ආර්ථික අර්බුද හා සමානුපාත නොවේ. වර්තමාන ආර්ථික අර්බුදයට, වර්තමාන ප්‍රතිපත්ති සුදුසු නොවන බව දැනටමත් පෙන්නුම් කරයි.

මහා පරිමාණ මුදල් සම්භාර ණයට ගැනීම සංවර්ධනය සඳහා සිදු කළත්, මානව සංවර්ධනය රජයේ ප්‍රමුඛ ආයෝජනයක් නොවන බව දැනටමත් පෙන්නුම් කෙරේ. එම තත්ත්වය නිසාවෙන් වත්මන් සංවර්ධනය හා සම්බන්ධ ණයට ගැනීම් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් දියුණු කිරීමක් හෝ දැනුම මත පදනම් වූ ආර්ථිකයක් ගොඩනැගීමට යෙදවීමක් වශයෙන් දක්නට නොලැබේ. රජය අධික මුදල් ප්‍රමාණයක් ණයට ගෙන යටිතල පහසුකම් සඳහා වැය කළද, සෞඛ්‍යය, අධ්‍යාපනය මෙන්ම සමාජ සුරක්ෂිතභාවය සඳහා ඇති ආයෝජන පහත වැටීමක් පෙන්නුම් කරයි.

ගෝලීය තරඟකාරීත්වය පෙන්නුම් කරන දර්ශකයෙහි (2014-2015) ශ්‍රී ලංකාව 63 සිට 75 දක්වා පහත වැටීම තුළින් මෙය මනාව පෙන්නුම් කරයි. ආයතන වල දුර්වලතාවය, නව තාක්ෂණ සඳහා සූදානම, ශ්‍රමික වෙළෙඳපොල කාර්යක්ෂමතාව සහ නවෝත්පාදනය යන්න දුර්වලතම දර්ශකයන් වශයෙන් මෙහි පෙන්නුම් කරනු ලබයි.


මේ වන විටත්, ශ්‍රී ලංකාව ඉහත සඳහන් මානව සම්පත් සංවර්ධනය සඳහා වැය කරන මුදල ඉතා අවම ප්‍රමාණයකි. උදාහරණයක් ලෙස 2012 දී සෞඛ්‍යය සඳහා පොදු ආයෝජනය ජාතික ආදායමින් 1.25% ක් වැනි ඉතා සුළු ප්‍රමාණයක් වන අතර එය දකුණු ආසියාවේ සාමාන්‍යය දර්ශකයෙන් සුළු ප්‍රමාණයකින් අඩු වන අතර, චීනය (3.03%), වියට්නාමය (3%), මැලේසියාව (2.17%) හා ඒ හා සමාන දියුණු වන රටවලට වඩා බොහෝ පහළින් පවතින්නකි.[5]

එසේම 2012 වසරේදී අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති ආයෝජනය ජාතික ආදායමින් 1.72% කි. එය දකුණු ආසියාවේ රටවලින් යොදා ඇති අඩුම ආයෝජන ප්‍රතිශතයයි (ආසියානු කලාපයේ සාමාන්‍යය 2.14% වේ). එසේම එම ප්‍රතිශතය තායිලන්තය (7.57%), මාලදිවයින (5.89%), මැලේසියාව (5.94% 2011), දකුණු කොරියාව (5.25% 2011) සහ ඉන්දියාව (3.35%) වැනි රටවලට වඩා ඉතාම පහළ අගයකි.[6]


සමාජ සුරක්ෂිතතාව සැලකූ විට ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂක දර්ශකයේ, ශ්‍රී ලංකාවේ දර්ශක අගය අනෙක් ආසියානු රටවල් සමඟ සැසඳු විට ඉහළමුත්, සමාන ආදායම් ලබන රටවල් සමඟ සැසඳු විට මධ්‍යම අගයක් පෙන්නුම් කරයි. 2010 වසරේදී සමාජ සුරක්ෂිතතාව සඳහා ආයෝජනය ජාතික ආදායමින් 2.8% ක් වූ අතර, එය 2009 වසරේ 3.2% විට පහළ වැටීමක් පෙන්නුම් කරයි.[7] මෙම පහළ වැටීමේ ප්‍රවණතා රටාව අනෙකුත් ඒ සමාන දර්ශක වලද දක්නට ලැබේ.

වයෝවෘද්ධ ජන සංඛ්‍යාව වැඩිවීමත්, ඉහළ ඉල්ලීමක් සහිත ජාත්‍යන්තර ආර්ථිකයත් හේතු කොට, සුදුසු සම්මත සෞඛ්‍යය තත්ත්වයන්, අධ්‍යාපන තත්ත්වයන් සහ සමාජ සුරක්ෂිතතාවන් පවත්වා නොගැනීම ශ්‍රී ලංකාවට අයහපත් බලපෑම් ඇතිවී අවදානම් තත්ත්වයක් උදා වීමට හේතු සාධක විය හැකිය. එනිසා පොදු ප්‍රතිපත්ති පොදු ජනයා විසින් වැඩි වශයෙන් නිරීක්ෂණය කළ යුතු වේ. වඩා වැදගත් වනුයේ, අන්තර්ජාතික මූල්‍ය අරමුදල සදහන් කළ පරිදි, ශ්‍රී ලංකාවට "යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ඉහළ මෙන්ම ස්ථිරසාර ආයෝජනක්", ආර්ථික වර්ධනය මෙන්ම විවිධාංගීකරණය සඳහා අත්‍යාවශ්‍ය වේ. මානව සම්පත් (අධ්‍යාපනය, සෞඛ්‍යය, ජීවන මට්ටම් වැනි) සහ යටිතල පහසුකම් වලින් එකක් සඳහා හෝ අඩු ආයෝජනයක් සිදු කිරීම, අනාගත වර්ධනය අඩු වීම හේතු කොට අඩු ආදායම් ලැබීමට හේතු වේ.

4 Central Bank of Sri Lanka – Key indicators (2013)
5 World Bank - World Development Indicators
6 World Bank – World Development Indicators
7 Asian Development Bank – SPI Index, Indicators




සෞඛ්‍යය සඳහා පොදු ආයෝජනය ජාතික ආදායමින් ප්‍රතිශතයක් ලෙස 2012




අධ්‍යාපනය සඳහා යොදා ඇති ආයෝජනය ජාතික ආදායමින් ප්‍රතිශතයක් ලෙස 2012

සාරාංශයක් ලෙස, ශ්‍රී ලංකාවේ ඉතා වටිනාම සම්පත වන මහජනයා වෙනුවෙන් ආයෝජනය නොකිරීම, රජයේ ප්‍රතිපත්තිමය දුර්වලතාවයක් පමණක් නොව, රටට අවශ්‍ය කරන සංවර්ධනය යනු කුමක්ද යන්න පිළිබඳව නිසි අවබෝධයක් නොමැති වීමද පෙන්නුම් කරයි. විශ්මිත ලෙස පෙන්නුම් කළ හැකි මහා පරිමාණ මාර්ග හෝ පාලම හෝ අධිවේගී මාර්ග කොපමණක් ඉදි කළත්, එතුළින් දුර්වල අධ්‍යාපන තත්ත්ව, පහත් සෞඛ්‍යය තත්ත්ව හා දුර්වල සමාජ සුරක්ෂිතතාවය සහිත ජනගහනයක් හානිපූරණය කළ නොහැකිය. එම පරිසර තත්ත්වය, මානව සම්පතෙහි දුර්වලතාව සහ අවදානම ඉහළ දමන අතර, එම අවදානම ශ්‍රී ලංකාව ඉහළ ආදායම් ලැබිය හැකි නවෝත්පාදන සහිත රටක් බවට පත් කිරීමට දැඩි බාධකයක් වේ.

අවශ්‍ය කරන ආයෝජන මානව සම්පත කෙරෙහි යොමු නොකර, ශ්‍රී ලංකාව හුදෙක් මාර්ග ඉදිකිරීමින් හෝ තේ අපනයනය කරමින් ඉදිරියට යාමට තැත් දරයි. ඒ වෙනුවට, ශ්‍රී ලංකාවට සමාජීය සහ සංස්කෘතික අයිතීන් යන අත්තිවාරම මත ගොඩනැගුණු, දැනුම මත පදනම් වූ ආර්ථිකයක් අවශ්‍ය වේ. මේ සඳහා කරන ආයෝජන බාහිරාලංකාරයෙන් තොර වුවද ලැබෙන්නා වූ ප්‍රතිඵල මහත් වේ.

නවම් නයිල්ස්[8]

8 Research Associate for SLYCAN , lecturer on global environmental problems and politics for the University of London Programme

# සංචාරක කර්මාන්තය නාමයෙන් ඉඩම් අත්පත් කර ගැනීම: කල්පිටිය දූපත් ප්‍රජාව

කල්පිටිය ජනයා ඔවුන්ගේ ජීවනෝපාය, ඔවුන්ගේ පවුල්, මානව අයිතිවාසිකම් සහ ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය රැකබලා ගැනීමට උත්සාහ දරමින් සිටිති. මේ සඳහා ඇතිවී ඇති ප්‍රධාන බාධකයක් වනුයේ සංචාරක කර්මාන්තය දියුණු කිරීමේ අදහසින් ප්‍රදේශයේ ජනතාව නොසලකා සිදු කරන පාරිසරික සහ නව ඉදිකිරීම් වේ. බොහෝ පුද්ගලයින් ඔවුන්ගේ අනාගත සුරක්ෂිතභාවය පිළිබඳව බියකින් පසු වේ.

**"පසුගිය අවුරුදු 70 80 කාලය පුරාවට අපි මෙහි ජීවත් වුණා. දැන් අපේ මිනිස්සු බය වෙලා ඉන්නේ, අපේ ඉඩම් සංචාරක කටයුතු වලට ගන්නවා කියලා කියන ආරංචිය නිසා. එහෙම වුණොත් අපේ රස්සා ඇතුළු අනෙක් හැමදේම අපට නැති වෙලා යනවා. රජය අපට උදව් කරයිද කියලා අපි දන්නේ නැහැ. නිළධාරින් අපට උදව් කරන්න අපේ ඉඩම් වල 'ඔප්පු' ඕනේ කියලා කියනවා. නමුත් තාම කවුරුත් අපට බලපෑම් කරන්න ඇවිල්ලා නැහැ."**

**අසංක කෲස් ධීවර සින්නමුන්නක්කරෙයි දූපත**

අසංක කල්පිටිය අර්ධද්වීපයේ සිටින තමන්ගේ මූලික අයිතිවාසිකම් සුරැකෙනු ඇතැයිද, නැවත ඔවුන්ගේ ඉඩම් ලබා ගැනීමට සහ ධීවර කටයුතු කිරීමට පහසුකම් සැලසෙනු ඇතැයි යනුවෙන් ද බලාපොරොත්තුවෙන් සිටින පුද්ගලයන් අතරින් කෙනෙකි. ඔහුගේ මෙම කැප කිරීම එතරම් පහසු කර්තව්‍යයක් නොවේ. එයට හේතුව මෙම ඉඩම් ඔවුන්ගේ උරුමය පමණක් නොව ජීවනෝපායද වන බැවිනි.

කල්පිටිය අර්ධද්වීපය පුත්තලම් දිස්ත්‍රික්කයේ පිහිටි දූපත් 14 කින් යුත් ප්‍රදේශයකි. මෙම දූපත් පුත්තලම් කලපුව ඉන්දියන් සාගරයෙන් වෙන් කරන අතර, එය නන්වැදෑරුම් ජෛව විවිධත්වයකින් යුත්, සමුද්‍රික අභයභූමියකි. එයට ගල්පර, වෙරළාශ්‍රිත සමතලා බිම්, ලුණු ලේවා. කඩොලාන වගුරු බිම් සහ විශාල මුහුදු වෙරළවල් අයත් වේ. ඩොල්ෆින්, මුහුදු කැස්බෑවන් සහ කොරල් පර බහුලව මෙම අභයභූමිය තුළ දක්නට ලැබේ. දූපත් 14 හි භූමි ප්‍රමාණය හෙක්ටාර 1672.67 (අක්කර 4133.19) වේ.

එසේම කල්පිටිය 64,908 ක ජනගහනයකින් (2009 ජන සංගණනය) යුක්ත ප්‍රදේශයකි. මින් 12,967 කුඩා පරිමාණ ධීවරයින් වන අතර, ප්‍රදේශයේ ස්ත්‍රීන්ගෙන් 25% ක් පමණ ධීවර කර්මාන්තයට සම්බන්ධ කටයුතු වල නිරත වන බව ආහාර සහ කෘෂි කර්මාන්ත සංවිධානය :ඵ්ඩ* කළ සමීක්ෂණයට අනුව වාර්තා වේ. කල්පිටිය ප්‍රදේශය ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය දියුණු කිරීමට නියමිත ප්‍රදේශ 15 න් එකකි. අක්කර 4000 ක භූමි ප්‍රමාණයක් සංචාරක ව්‍යාපෘති සඳහා අත්කර ගැනීමට කැබිනට් තීරණයකින් අවසර ලබා දුන් පසු 2004 වසරේ සිට එය ආරම්භ කර ඇත. මේ හේතුව උදෙසා විශාල ප්‍රමාණයක් අයිති කර ගැනීම නිසා පුද්ගලයින් 2500 කට පමණ ඔවුන්ගේ ඉඩම් අහිමි වී ඇත.

මෙම 2500 ක් පමණ ඉඩම් රහිත පුද්ගලයින්ට ඔවුන්ගේ දේපල අහිමි වී ඇත්තේ පහත සඳහන් ගැටළු සහගත ක්‍රමවේදයන් තුළිනි.

1. ඉඩම් හිමියන් ඉඩමේ ජීවත් නොවන අවස්ථා වල හෝ මිය ගොස් ඇති අවස්ථාවක හෝ අඩු මුදලට විකිණීමට ඇති අවස්ථා වල (උදා: සුනාමියෙන් පසු) ඉඩම් අත්පත් කර ගැනීම.

2. රජයේ ලේඛන වලින් නම ඉවත් කිරීම (උදාහරණයක් ලෙස ඡන්දදායක ලැයිස්තුවෙන් නම ඉවත් කිරීම).

3. වෙරළාශ්‍රිත ධීවර කර්මාන්ත කරන ස්ථාන, නැංගුරම්ලන ස්ථාන අත්පත් කර ගැනීම.

4. අයිතිවාසිකම් පිළිබඳ විවිධ "නීතිමය" ලිපිලේඛන මඟින් පදිංචිකරුවන්ට තමන්ගේ ඉඩම් පිළිබඳ අයිතිය (ඔප්පු) ඉදිරිපත් කිරීමට ඉඩ නොදීම.

මෙම ඉඩම් අයත් කර ගැනීම් වල අර්ථලාභීන් වන්නේ යුධ හමුදාව, සංචාරක කර්මාන්තය හා සම්බන්ධ පුද්ගලික ආයෝජකයින් සහ ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය සහ නාගරික සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතනයන්ය. මෙම ආයෝජකයින් ඉඩම් සඳහා ඔප්පු ලබාගත් ආකාරය අපැහැදිලිය.

එනමුත්, අසංක වැනි පුද්ගලයින් බලාපොරොත්තු වී සිටින වන්දි මුදල් හෝ නැවත ඉඩම් ලබා ගැනීමේ අවස්ථා, ශ්‍රී ලංකා මහා බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් විසින් කරන ලද ප්‍රකාශ වලින් ඉටු නොවන බවක් පෙන්නුම් කරයි.

ඔහු කියා සිටියේ, "මීගමු ධීවරයින් මෙරටේ සංචාරක කර්මාන්තයට විරුද්ධ වුවද, ධීවර ජනයා ඔවුන්ගේ ඉඩම් කැමැත්තෙන්ම ලබා දී සතුටින් සංචාරක කර්මාන්තයෙන් ලාභ ලබා ගැනීමට සූදානම්ව සිටී" බවය.

කබ්රාල් මහතා මෙම ප්‍රකාශය සිදු කළේ සැප්තැම්බර් මස මුල දින වලදී රක්ෂණ සංස්ථා සමඟ පැවැත්වූ සාකච්ඡාවකදීය. ඔහු කල්පිටිය ධීවරයින් ඔවුන්ගේ ජීවනෝපාය හා සම්බන්ධ ඉඩම් ස්වේච්ඡාවෙන් ලබා දුන්නේ යන නිගමනයට පැමිණියේ කෙසේදැයි යන්න අපැහැදිලිය. ඔහු කල්පිටිය ධීවර ජනයා සමඟ සාකච්ඡා කළේද? ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳ විමසා සිටියේද? යන්න නොදනී. දැනට පවතින තොරතුරු වලට අනුව එවැනි දෙයක් සිදු වී නොමැත.

වාර්තා වලට අනුව ව්‍යාපෘති ඇගයීම පිළිබඳ නිසි පාරදෘශ්‍යභාවයක් නොමැති වීමත්, ජනතාවට තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමේ හැකියාව සීමිත වීමත් දක්නට ලැබේ. ඔවුන්ගේ ජීවන ක්‍රමයට සෘජුව බලපාන, මෙම මහා පරිමාණ සංචාරක ව්‍යාපෘති පිළිබඳ පූර්ව දැනුවත් කිරීමක්වත් සිදුවී නොමැත.

**"අපේ ඉඩම් සංචාරක ව්‍යාපෘති වලට ගන්න එපා. අපි මේ ඉඩම් පැවරීම ගැන දන්නේ නැහැ. අපිට කවුරුත් මේ පිළිබඳව කිව්වේ නැහැ."**

**මේරි ප්‍රනාන්දු සින්නමුන්නක්කරෙයි දූපත**



Photo: James Gordon

විවිධ ඉදිකිරීම් සහ වෙනස් කිරීම් මෙම ඉඩම් වල සිදු කර ඇති අතර, ඒවාට හෝටල් 16 ක් සහ එම හෝටල් සඳහා යන මාර්ගද අයත් වේ. මේ නිසා ධීවර ජනයා විස්තාපනය (අවතැන්) වී අත. කල්පිටිය අර්ධද්වීප මුහුදු කලාපය ලංකාවෙන්ම ඉහළ අස්වැන්නක් ලබා දෙන මත්ස්‍ය බිම් වලින් එකක් වුවත්, නව ඉදිකිරීම් වලින් සිදුවන බලපෑම නිසා මෙම මුහුදු බිම් වල මත්ස්‍ය අස්වැන්න අඩු වෙමින් පවතී.

ප්‍රාදේශීය නිෂ්පාදිතය අවම වීම ධීවර ජනයාගේ ආදායම අවම වීමට සෘජුව බලපානු ලැබේ. ප්‍රජා මට්ටමේදී ආදායම අඩු වීම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වීමට හේතු සාධක වේ. ජාතික මට්ටමේදී මෙය අඩු වී ඇති හෝ අඩු වෙමින් පවතින අයවැයකරණය සහ බාල සේවා තුළින් පිළිඹිබු වේ. එසේම එය සියල්ලන්ම සහභාගි කර ගන්නා යයි පවසන රජයේ සංවර්ධන ප්‍රතිපත්ති හා සමගද එකඟ නොවේ. තවද, කල්පිටිය කරවල (වේලූ මාළු) නිෂ්පාදන මුළු ලංකාවේම ප්‍රචලිත නිෂ්පාදනයකි. වසරක් තුළ මෙම දූපත් වල පූර්ණ කරවල නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 250 ත් 400 ත් අතර වේ. මෙය ධීවර ජනතාවගේ ආදායම පමණක් නොව, ජාතික ආදායමටද දායක වන්නා වූ කරුණකි. මෙම දූපත් වලින් ලැබෙන කරවල නිෂ්පාදනය නිසා වාර්ෂිකව පිටරටින් මත්ස්‍ය නිෂ්පාදන ගෙන්වීමට වැය වන මිලියන ගණනක විදේශ විනිමය මුදල් ඉතිරි වේ.

කල්පිටිය ජනතාවට ඔවුන්ගේ ඉඩම් සහ සම්පත් අහිමි වීම කරුණු දෙකක් තුළින් පෙන්නුම් කරයි එම වැසියන්ගේ ජීවනෝපාය අස්ථාවර වීම සහ ආහාර ස්වාධීනත්වය අහිමි වීම. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් නිර්ධන බවට පත්වීම, ආහාර සහ පෝෂණය පිළිබඳ අස්ථිරතාවක් ඇති වීම සිදු වේ.

එනමුත් සෑම දෙයක්ම විනාශ වී නොමැත. එම ජනතාවට ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව තවම නැතිවී නැත.

**නිරෝෂන් කුරේරා උච්චිමුනේ**

"අපිට වෙන ජීවන ක්‍රමයක් නැහැ. අපිට අපේ ජීවනෝපාය අතහැර දාන්න බැහැ. මේ දූපතේ ධීවර කර්මාන්තයට අපි බැඳිලා ඉන්නෙ. අපේ ජීවිතත් මේ දූපත් එක්ක බැඳිලා තියෙන්නේ."

"සංඝ සභාවක් විදිහට අපි මේ මිනිස්සුන්ට උදව් අවශ්‍ය නිසා ඉදිරිපත් වෙලා ඉන්නේ. මේ මිනිස්සුන්ට මෙම බලපෑම් හා සටන් කරන්න අමාරුයි. ඉඩම් අත්පත් කරගැනීමත් මෙම සංචාරක ව්‍යාපාරයේ එක් අයුතු ප්‍රතිඵලයක්. එනිසා මේ සඳහා ශක්තිමත් ක්‍රියාමාර්ග ගන්න සංඝයා වහන්සේලා සහ ජනතාව ලෙස අපි සූදානම් වෙලා ඉන්න ඕනේ" පූජ්‍ය බණ්ඩිවැව දියසේන හිමි, නායක හිමි, ශ්‍රී සමුද්‍රසාන විහාරය, කන්දකුලිය, කල්පිටිය.

මෙම ස්වාමින් වහන්සේ ඇතුළු ස්වාමින් වහන්සේලා රැසක් කල්පිටිය විරෝධය පළ කර ඇත.

බලධාරීන්ට බියේ වුවද විරෝධතා ප්‍රකාශ කිරීම සිදු කරන අතර ඉඩම් අත්පත් කරගැනීමට විරුද්ධ වන පිරිස (ස්වාමින් වහන්සේ ඇතුළු) නොකඩවා වැඩිවීම, මෙම සංචාරක ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පීඩාකාරී බව පැහැදිලිව පෙන්නුම් කරනු ලබයි.

**එව්ජීන් ප්‍රනාන්දු උච්චිමුනේ**

"අපි කිසිම හේතුවක් නිසා අපේ ගම් දාලා යන්ට සූදානම් නැහැ. අපි කොහේ යන්නද? අපිට මුහුදෙන් ඈත ඉඩම් වල ඉදල ධීවර රස්සා කරන්න බැහැ. අපි ඔය යෝජනා පිළිගන්න සූදානම් නැහැ. අපි දන්නා රස්සාව, ධීවර රස්සාව. එනිසා අපිට අපේ ජීවනෝපාය (රස්සාව) කරන්න මෙහෙ ජීවත් වෙන්න ඕනේ. සමහරු මුදල් වලට තැන දාල යන්න කැමති ඇති. නමුත් අපි මේ දේවල් දාලා යන්න සූදානම් නැහැ. අපිව බලධාරින් බලෙන් ඉවත් කරන්න උත්සාහ කළොත් අපි කිරිමුන්දල් (මෙහාට එන්න කලින්) වලදී මොවුන්ව නවත්වන්න උත්සාහ කරනවා. අපේ ළමයින්ගේ අනාගතේ සහ අපේ අනාගතේ මෙම යෝජනා වලට රැවටී විනාශ කරගන්න බැහැ."

හර්මන් කුමාර[1]

1 ජාතික කැඳවුම්කරු, ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය (NAFSO)

***Published with support from CCFD***

*Send your stories, photos and cartoons to lst.escrprogram@gmail.com*

*Signed articles are the view of the writer.*

*Published in Sinhala, tamil & English and downloadable from*
*http://www.lawandsocietytrust.org/resources.html*